සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට වරහන තුළ දී ඇති වචන වලින් හිස්තැන් පුරවන්න.**

01 අලුතින් ගිනි තබා සකස් කර ගත් භූමිය ........................................ ලෙස හඳුන්වයි.

02 ගම් වැව් තැන වූ අය පැරණි ශිලා ලිපිවල ........................................ ලෙස හඳුන්වා ඇත.

03 වෙළඳාමට සම්බන්ධ වූ වෙළඳ සංවිධාන ........................................ ලෙස නම් කළේය.

04 පොළොන්නරු යුගයේ මුල්ම පාලකයා ........................................ රජතුමායි.

05 කිරි ලබා ගැනීම සඳහා යොදාගත් ගව දෙනුන් ........................................ ලෙස හඳුන්වා ඇත.

(වපිහමික, හැලිකටා, පුග, කිරිගෙරි, නවදලිහේන, I වන පරාක්‍රමබාහු, I වන විජයබාහු, චෝලයන්, පල්ලවයන්)

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල යොදන්න.**

06 අතීතයේ හේන්වල වගා කළ වී ඇල් වී ලෙස හඳුන්වනු ලැබේ. ( )

07 සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් මධුපාචිකා ලෙස හඳුන්වයි. ( )

08 අලුතින් සකස් කළ හේන සෙල්ලිපි වල පිටිබිම් ලෙස හඳුන්වයි. ( )

09 දකුණු ඉන්දියාවේ පල්ලව රාජ්‍යයේ අගනුවර තන්ජෝරයයි. ( )

10 සාම්ප්‍රදායික කලා ශිල්ප ස්පෘශ්‍ය උරුමයකි ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

11 මෙම පින්තූර සටහනේ දක්වෙන අතීතයේ සිට පැවත එන සංස්කෘතික උරුමය කුමක් ද?



(1) වෙස්මුහුණු හා රූකඩ කලාව

(2) ලාක්ෂා හා චිත්‍ර කලාව

(3) පන්කොළ ආශ්‍රිත කලාව

(4) පිත්තල හා කැටයම් කලාව

12 මෞර්‍යය රජ පෙළපතට අයත් පාලකයෙක් වන්නේ මින් කවරෙක් ද?

(1) වසභ රජතුමා (2) මානවම්ම රජතුමා (3) ධාතුසේන රජතුමා (4) දුටුගැමුණු රජතුමා

13 යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස නම් කළ ස්ථානයක් වන්නේ මින් කුමක් ද?

(1) පෙඩ්‍රික් කොටුව (2) කොළඹ කොටුව (3) පිට කොටුව (4) ගාලු කොටුව

14 ලංකාව සමඟ ඉතා දියුණු වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටක් වන්නේ මින් කුමක් ද?

(1) අරාබිය (2) ඇමෙරිකාව (3) මාලදිවයින (4) මලයාසියාව

15 පහත සඳහන් උරුමයන් අතරින් අස්පෘශ්‍ය උරුමයක් වන්නේ මින් කුමක් ද?

(1) ලී කැටයම් (2) බලකොටු (3) ජනකවි (4) පොකුණු

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර දී ඇති හිස්තැනෙහි ලියන්න.**

16. පැරණි මූලාශ්‍රය වල ගවයන් රැකබලා ගත් පුද්ගලයන් ජීවත් වූ ගම හැඳින්වූ නම කුමක් ද?

.................................................................................................................................

17. අතීත මිනිසා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගත් ශිල්ප ක්‍රමය කුමක් ද?

.................................................................................................................................

18. තෝනිගල ශිලා ලිපියේ මහ කන්නය හඳුන්වා ඇති නම කුමක් ද?

.................................................................................................................................

19. වරාය ආශ්‍රිත කටයුතු වල නිරත වූ නිලධාරීන් හැඳින්වූ නම කුමක් ද?

.................................................................................................................................


20. මෙම පින්තූරයේ දක්වෙන්නේ අතීතයේ වෙළඳ සබඳතා පැවැත් වුණු බවට සාධකයකි එම සාධකය කුමක් ද?



(20 x 2 = 40)

**07 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඉන්දියාවේ සිතියම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




01. (අ) (i) නිශ්ශංකමල්ල රජුගේ උපන් දේශය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද? (ල. 02)

(ii) දකුණු ඉන්දියාවේ මුල් වරට අධිරාජ්‍යයක් ගොඩනැගූ රට දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(iii) මදුරාපුරය අගනුවර කරගත් රාජ්‍යය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(ආ) පොළොන්නරු යුගය පාලනය කළ කීර්තිමත් රජවරු ඇසුරින් දක්වා ඇති වගුවේ හිස්තැන් පුරවන්න.(ල. 02)

| රජු | සඳහන් වන තොරතුරු | මූලාශ්‍රය |
|---|---|---|
| පළමු විජයබාහු | ළමා කාලය | (i) ............................................. |
| (ii) ............................................. | බුරුම ආක්‍රමණය කළ නගරගිරි කීර්තිට දුන් තෑග්ග පිළිබඳව | දෙවන ගල සෙල්ලිපිය |
| පළමු විජයබා රජු | (iii) ............................................. | අඹගමු සෙල්ලිපිය |

(ල. 06)

(ඇ)



(i) මෙම පින්තූරයෙන් දැක්වෙන ලෝක උරුමය කුමක් ද? (ල. 02)

(ii) එය ලෝක සංස්කෘතික උරුමයක් ලෙස නම් කළේ කුමන අරමුණකින් ද? (ල. 02)

02. (i) පහත සඳහන් වන්නේ අතීත ජන සමාජය පිළිබඳ තොරතුරු සපයාගත හැකි මූලාශ්‍ර දෙකකි. එම මූලාශ්‍රවලට අදාළ තොරතුරු වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න.

A - වේවැල්කැටිය ශිලා ලිපිය

B - අන්තානී කණු (ල. 02)

(අපරාධ නඩු විසඳීම, මූල්‍ය කළමණාකරණය, රාජ්‍යය දිමනා, විහාර වල අය වැය)

(ii) පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා දැදුරු ඔයේ ජලය කෘෂිකටයුතු වලට යොදා ගැනීම සඳහා එම ඔය හරස්කර තුන් තැනකින් අමුණු බැඳි බව සඳහන් වේ. එසේ අමුණු බැඳී ස්ථාන 03ක් නම් කරන්න. (ල. 03)

(iii) අතීත රජවරු සමාජ ශුභසාධන කටයුතු සඳහා ඉතා උනන්දුවෙන් දායක වී ඇත. ඔවුන් කළ ශුභ සාධන කටයුතු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රජු | කරන ලද ශුභසාධන කාර්ය |
|---|---|
| (i) ............................................. | ගම් දහයකට වෛද්‍යවරයකු බැගින් පත් කිරීම |
| පළමුවන උපතිස්ස රජු | (ii) ............................................. |
| (iii) ............................................. | වසංගත රෝගීන් සඳහා ආරෝග්‍යශාලා ඉදිකිරීම |

(ල. 06)



03. (i) A මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ල. 01)

B එය පිහිටා ඇති ස්ථානය කුමක් ද? (ල. 01)

(ii) නිශ්ශංක මල්ල රජතුමා විසින් කරවන ලද සෙල්ලිපි 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) I වන විජයබාහු රජතුමාගේ චරිතයෙන් පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 03 ක් සඳහන් කර ඔබේ ශිෂ්‍යා ජීවිතයට එය ගලපා ගත හැකි ආකාරය පිළිබඳ විස්තර කරන්න. (ල. 06)



04. (i) A පින්තූරයේ දැක්වෙන්නේ කුමන කලා ශිල්පයට අයත් නිර්මාණයක් ද? (ල. 01)

B වෙස්මුහුණු නිර්මාණයට යොදා ගත් රූප මොනවාද? (ල. 01)

(ii) යුනෙස්කෝ සංවිධානය විසින් ලංකාවේ ලෝක උරුම ලෙස පිළිගත් ස්ථාන 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) පහත සඳහන් සංස්කෘතික උරුම ස්පෘශ්‍ය උරුම හා අස්පෘශ්‍ය උරුම ලෙස තෝරා වගුගත කරන්න.

* දෙමාපියන්ට බුලත් දී වැඳීම
* කුට්ටම් පොකුණ
* ජන නැටුම්
* රුවන් වැලි සෑය
* විවිධ කෙම්ක්‍රම
* ජන නැටුම්

| ස්පෘශ්‍ය උරුම | අස්පෘශ්‍ය උරුම |
|---|---|
| * | * |
| * | * |
| * | * |

(ල. 06)

05. (i) පහත සඳහන් ස්ථාන අතරින් ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් වන පැරණි පොළොන්නරු නගරය තුළ පිහිටි ආගමික ස්ථාන 2 ක් නම් කරන්න.

* රන් මසු උයන * තිවංක පිළිමගෙය
* කැටපත් පවුර * අභයගිරිය
* රන්කොත් වෙහෙර * ලෝවාමහාපාය (ල. 02)



(ii) (අ) මෙම පින්තූරයෙන් දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුමයකි. එය නම් කරන්න. (ල. 01)

(ආ) මෙය ලෝක උරුමයක් ලෙස නම් කළේ කුමන සාධකයක් පදනම් කර ගෙන ද? (ල. 01)

(ඇ) මෙම නිර්මාණය කර ඇත්තේ කුමන ස්වභාවික පිහිටීමක් මුල් කරගෙන ද? (ල. 01)

(iii) අතීත රජවරු තම උත්සව අවස්ථා වලදී අස්පෘශ්‍ය උරුමයක් වූ රංගකලාවට වැදගත් තැනක් ලබාදුන් ආකාරය උදාහරණ තුනක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල. 06)

06. (i) සීගිරිය විශිෂ්ට කලාගාරයක් ලෙස කීමට හැකි සාධක 02ක් නම් කරන්න. (ල. 02)

(ii) සීගිරිය කලාගාරයක් ලෙස හා බලකොටුවක් ලෙස වැදගත් වූයේ ගෘහ නිර්මාණ ශිල්පියාගේ පැවැති තාක්ෂණික කුසලතාවය නිසාය. එම තාක්ෂණික විශිෂ්ටත්වය පිළිබිඹු වන ස්ථාන 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) පහත සඳහන් උපකාරක පද උදව් කරගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

1. අස්පෘශ්‍ය උරුමයකි.
2. සිංහල භාෂාවට මෙම භාෂාවෙන් වචන පැමිණ ඇත.
3. රජු ජීවත් වූ නිවහන හැඳින් වූ නම
4. සම්ප්‍රදායික කැටයම් නිර්මාණය සඳහා මෙම ලෝහය භාවිතා කර ඇත.

<u>හරහට</u>

1. පැරණි අනුරාධපුර නගරයේ පිහිටි උද්‍යානයකි.
2. ඇතැමුන් සීගිරිය .................................... ලෙස හඳුන්වයි.


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 2 දෙ | | | | |
| 1 ර | | | | | | න |
| | | | | | | |
| | | | | | | |
| 2 ක | | | 3 ර | | | |
| | | | | | | 4 පි |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

07\. (i) ලංකාවේ වෙස්මුහුණු කර්මාන්තයට ප්‍රසිද්ධ ස්ථාන 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) රජරට ශිෂ්ටාචාර සමයේ අස්පෘශ්‍ය උරුම ලෙස සලකන ජනතාව එකතු වී කළ පොදු උත්සව 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) යුනෙස්කෝ සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ ලෝක උරුමයන් ලෙස නම් කළ ස්ථාන 6ක් පිළිවෙලින් දක්වා ඇත. එම ස්ථාන වලට අදාළ අංක ඔබට ලබා දී ඇති සිතියමේ ඉංග්‍රීසි අක්ෂර හිස්තැන් වලට ගැලපෙන පරිදි යොදන්න.

1. පැරණි අනුරාධපුර නගරය
2. පැරණි පොළොන්නරු නගරය
3. සීගිරිය
4. රන්ගිරි දඹුලු විහාරය
5. දළදා මාලිගය ඇතුළු මහනුවර නගරය
6. ගාලු කොටුව (ල. 06)



## පිළිතුරු පත්‍රය - I කොටස

01. නව දූලි හේන 02. වපිහමික 03. පුග 04. පළමුවන විජයබාහු 05. කිරිගෙරි 06. (✓) 07. (✓)
08. (✓) 09. (✗) 10. (✗) 11. (2) 12. (3) 13. (4) 14. (1) 15. (3)
16. ගෝපාල ගම් 17. තවලම 18. අකලහස 19. රේගු නිලධාරින් 20. චීන කාසි/කාසි

(2 x 20 = ල. 40)

## II කොටස

01. (අ) (i) A (ii) B (iii) C (ල. 06)
(ආ) (i) පනාකඩු තඹ සන්නස (ii) දෙවන ගල සෙල්ලිපිය
(iii) පළමුවන විජයබාහු රජුගේ යහපත් ගුණාංග (ල. 06)
(ඇ) (i) චීන මහා ප්‍රාකාරය (ල. 02)
(ii) චීනයට ආරක්ෂාව සැපයූ පවුරක් වීම නිසා හා චීන සංස්කෘතියේ ප්‍රබල සංකේතයක් නිසා (ල. 02)

02. (i) A අපරාධ නඩු විසඳීම B - රාජකීය දීමනා (ල. 02)
(ii) ● කොට්ඨ බද්ධ අමුණ ● සූකර නිජ්ඣර අමුණ ● දෝරු දත්තික අමුණ (ල. 03)
(iii) (i) බුද්ධදාස රජතුමා (ii) අන්ධයින් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා ඉදිකිරීම
(iii) V වන කස්සප රජු (ල. 2 × 3 = 6)

03. (i) A ගල් විහාර පිළිමය B පොළොන්නරුවේ උත්තරාරාමය හෙවත් ගල් විහාරය (ල. 01)
(ii) ගල්පොත ශිලා ලිපිය, හැටදාගෙයි ලිපිය, දඹුලු පර්වත ලිපිය, වාඳුරුප්ප ලිපිය (ල. 03)
(iii) ⋆ අවංකකම ⋆ කෘතගුණ සැලකීම ⋆ ජය පරාජය විඳගැනීම විස්තර කිරීමට (ල. 06)

04. (i) A වෙස්මුහුණු හා රූකඩ කලාවට B දේවරූප හා යක්ෂ රූප (ල. 02)
(ii) පැරණි අනුරාධපුර නගරය, පැරණි පොළොන්නරු නගරය
සීගිරිය, රන්ගිරි දඹුලු ලෙන් විහාරය
දළදා මාලිගය ඇතුළු මහනුවර නගරය, ගාලු කොටුව (ල. 06)
(iii) ස්පර්ශ උරුම, අස්පෘශ උරුම
කුට්ටම් පොකුණ, දෙමාපියන්ට බුලත් දී වැඳීම
රුවන්මැලි සෑය, ජන නැටුම්
විවිධ කෙම් ක්‍රම
ජන නැටුම

05. (i) තිවංක පිළිමගෙය රන් කොත් වෙහෙර
(ii) (අ) රන්ගිරි දඹුලු රජමහා විහාරය (ආ) පැරණි සිතුවම් සහිත ලෙන් විහාරය
(ඇ) ගල තුළ නිර්මාණය කළ ස්ථානයක් වීම
(iii)
- රුවන්මැලිසෑයට මුල්ගල තැබීමේ උත්සවයට දුටුගැමුණු රජතුමා දිව්‍ය කන්‍යාවන් හා සමාන නාට්‍යාංගනාවන් පෙරටු කරගෙන පෙරහැර තිබීම.
- දෙවන පැරකුම් රජු නානාප්‍රකාර නැටුමෙන් යුතු උත්සව පැවැත්වීම
- පළමු පැරකුම්ගේ කාලයේ නැටුම් ගැයුම් වැයුම් සහිත උත්සව පැවැත්වීම

06. (i) කැටපත් පවුර කුරුටු ගී
සීගිරි සිතුවම්
(ii) සිංහ පාදය හා පියගැට පෙළ
ජල මල්
සීගිරි උද්‍යාන
(iii) **පහළට** 1. රංග කලාව 2. දෙමළ 3. රජමාළිගා 4. පිත්තල
**හරහට** 1. රන්මසු උයන 2. කලාගාරයක් (ල. 06)

07. (i) අම්බලංගොඩ උඩුපිල (ල. 02)
(ii) වෙසක් උත්සවය ජල ක්‍රීඩා උත්සවය වප් මඟුල් උත්සවය (ල. 03)
(iii) A - අනුරාධපුර නගරය B - පොළොන්නරු නගරය
C - සීගිරිය D - මහනුවර
E - ගාලුකොටුව F - දඹුලු විහාරය (ල. 06)